
# වතුකරයට ඇස් යොමුවීම




වතුකරයේ ප්‍රජාව මුහුණ දෙන ගැටලු පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් හෝ අවධානයක් ලාංකික සමාජයෙහි නැති බව පැහැදිලි ය. එබදු අවබෝධයකින් තොරව ශිෂ්ට සම්පන්න රටක් ලෙස ලෝකයට මුහුණ දීමේ හැකියාවක් ලංකාවට නොලැබෙනු ඇත.

එබැවින් මේ පිළිබඳ පුළුල් සමාජ සංවාදයක් ගොඩනැගීම අද දවසේ කාලීන අවශ්‍යතාවයකි. එම අරුතින් ගත් කල කෙයාර් ජාත්‍යන්තරය සහ සමාජ සංවර්ධන ආයතනය මගින්



ඉදිරිපත් කළ 'ශ්‍රී ලංකාවේ වතු ප්‍රජාව උදෙසා සේවා පහසුකරණය කිරීමේ ව්‍යාපෘති' ධනාත්මක ප්‍රතිලාභ සහ අත්දැකීම් හුවමාරු කර ගැනීමේ වැඩසටහන් කාලීන වැදගත්කමකින් යුතු බව කිව හැකි ය.

ප්‍රජාවක් ලෙස වතුකරයේ ප්‍රජාව මුහුණ දෙන්නා වූ ගැටලු හා එම ගැටලු සමනය කර ගනිමින්, ඔවුන්ට ලබාදෙන සේවාවන් විධිමත් කිරීම පිළිබඳව මෙහිදී මූලික වශයෙන් අවධානය යොමු වූ අතර වතු ප්‍රජාවගේ සංස්කෘතික භාෂාමය ආර්ථික හා තාරුණ්‍ය සම්බන්ධ ගැටලු රාශියක්ම එහිදී සාකච්ඡා කරන්නට යෙදිණි.

වතුකරයේ භාෂා ප්‍රශ්නය පිළිබඳව අනාවරණය වූ පරිදි එහි රජයේ පරිපාලන ආයතන ව්‍යුහය තුළ ඇතැම් පෝරම තවදුරටත් ත්‍රෛභාෂාවෙන්ම නිකුත් නොකරන බවත් ප්‍රදේශීය ලේකම් කාර්යාලයන්හි ව්‍යවස්ථාවන් (දැක්ම) ත්‍රෛභාෂාවෙන්ම දැක්වීමට කටයුතු සම්පාදනය කරමින් පවතින බවත් හෙළි විය.

එසේම 'සේවා පියස' ව්‍යාපෘතිය වතුකරයේ ජනතාවට සිය අවශ්‍යතා හා සන්නිවේදන කටයුතු පවත්වා ගැනීමට මනා පිටිවහලක් වන බවද සඳහන් විය. **වතුකරයේ පමණක් නොව සමස්ත රාජ්‍ය සේවයේ නිලධාරීන් අතර දමිළ භාෂාවේ නිපුණත්වයක් ඇති නිලධාරීන්ගේ හිඟයක් පැවතීම නිසා ඇතැම් අවස්ථාවලදී දමිළ ජනතාවගේ භාෂා අයිතිවාසිකම් මෙහි දී කඩ වන බව ද සඳහන්ය.** මේ සඳහා දමිළ රාජ්‍ය සේවකයන් බඳවා ගැනීම හා අද දවසේ සේවයේ නියැලෙන රාජ්‍ය සේවකයන්ට දමිළ භාෂා පුහුණුවක් ලබා දිය යුතු බව නිර්දේශ වශයෙන් ඉදිරිපත් විය.

මෙම ජනතාව දේශපාලනික වශයෙන් මුලාවට ලක් වී ඇති බවත් ඊට විසඳුමක් ලෙස විධිමත් අධ්‍යාපන ක්‍රමවේදයක් හා උසස් අධ්‍යාපන අවස්ථාවක් කරා යොමු වීමේ අවශ්‍යතාවයක් අවශ්‍ය විය. මෙම ප්‍රවේශයන්හි අඩුපාඩුවක් පවතින බව දක්වමින් වතුකරයේ තරුණ ප්‍රජාව රැකියා අවස්ථා සඳහා තම උපන් ගම්න් බැහැරට යන බව තවදුරටත් සඳහන් විය. වත්මන් ගෝලීකරණය තුළ තාක්ෂණික හා දැනුම ගවේෂණය සඳහා වතුකරයේ තරුණ ප්‍රජාවට ආර්ථික වශයෙන් හා සමාජීය වශයෙන් ඇති අභියෝගයන් රැසක් පවතින බවද අනාවරණය විය.

මෙම ප්‍රජාව ආකාර දෙකකින් එනම් දමිළ වීම හා ආර්ථික දුෂ්කරතා යන සියලු ආකාරයන්ගෙන් වෙනස් කොට සැලකීමට ලක්වන බව මෙහිදී ප්‍රකාශ විය. ප්‍රධාන වශයෙන්ම මොවුන් මුහුණ දෙන බරපතල ප්‍රශ්නයක් ලෙස, විශ්‍රාම යාමෙන් අනතුරුව ඔවුන්ට ජීවත් වීම සඳහා තමන්ගේම නිවහනක් නොමැති වීම හා ඉඩම්වල හිමිකාරිත්වය සම්බන්ධ ගැටලුව ප්‍රබලවම පවතින බව පැහැදිලි විය. ආර්ථික වශයෙන් සෑහීමකට පත්විය නොහැකි වාතාවරණයක් මත හා අධ්‍යාපනික අවස්ථාවන් කරා යොමු වීමේ ගැටලු උග්‍රවී ඇත. එමෙන්ම සංස්කෘතික ජීවිතයද දිනෙන් දින පරිහාණියට පත් වන්නේ යැයි ප්‍රකාශ විය.

මෙකී අර්බුදයන් විසඳා ගනු වස් වතු ප්‍රජාවට පහළ මට්ටමේ සිටම දියුණු නායකත්ව හැකියාවන් ප්‍රවර්ධනයට පුහුණු වැඩසටහන්, නායකත්වය සඳහා තරුණ නියෝජනය වැඩි කිරීමටත්, සෑම වතු ප්‍රදේශ සඳහා 'සේවා පියස' ගොඩනැගිලි ස්ථාපනය කිරීමටත් යෝජනා විය. ස්වයං රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීමටත්, නවීන අධ්‍යාපන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි අධ්‍යාපනික පහසුකම් ඇතිකිරීමටත්, මෙම ප්‍රජාවගේ අයිතීන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පුළුල් කිරීමටත් යෝජනා විය. විශේෂයෙන් පරිහානියට පත් වෙමින් පවත්නා සංස්කෘතික උරුමයන් හා පරිචයන් රැක ගැනීමට වැඩසටහන් වර්ධනය කිරීමේ අවශ්‍යතාවය අවධාරනය කෙරිණි. තීරණ ගැනීම උදෙසා කාන්තා සහභාගීත්වයද ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිපාදන හා වැඩිහිටි සුරක්ෂිතභාවය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සඳහා සාධාරණ හා විධිමත් විසඳුම් ක්‍රියාත්මක කළ යුතු බවට යෝජනාවන් නිර්දේශ වශයෙන් මෙහිදී ඉදිරිපත් විය.

මේ හරහා හෝ වතු ජනතාවට තම අපේක්ෂාවන් ඉටු කර ගනිමින් සැබෑ ශ්‍රී ලාංකික පුරවැසියන් ලෙස ජීවත් වීමට අවකාශ සැලසෙන්නේ නම් එය ඔවුන්ගේ යහපතට හේතුවන අතරම රටේ ඉදිරි ගමනටද ප්‍රධාන හේතුවක් වනු ඇත.

දුමිඳු මධුෂාන්



Scanned with CamScanner